උපකාරක වැඩසටහන

**අධ්‍යාපන පොදු සහතික පත්‍ර ( උ. පෙ ) විභාගය - 2020**

කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය - කුරුණෑගල

## **ලංකා ඉතිහාසය** ii

1) ඉතිහාසය යනු කුමක්දැයි හඳුන්වා ඉතිහාසය ඉගෙනීමෙන් ඇති ප්‍රයෝජන පිළිබද විග්‍රහයක යෙදෙන්න.

- ඉතිහාසය පිළිබඳ නිර්වචන

  I. ක්‍රිස් හර්ට්ස්
  II. ජෝන් ජේ
  III. ආර්.පී.කොලින්වුඩ්
  IV. ජී.එම්. ට්‍රෙව්ලියන්
  V. ඩබ්.සී. සෙලර් හා ආර්. ජේ. යෙට්මෑන්

- පොදු නිර්වචනයක් ගොඩ නැගීම.
- ඉතිහාසය ඉගෙනීමෙන් ඇති ප්‍රයෝජන උදාහරණ සහිතව විස්තර කිරීම.

2) ඉතිහාසය හැදෑරීමේ දී මහාවංසයෙහි වැදගත් කම හා මූලාශ්‍රයක් ලෙස මහාවංසයෙහි ඇති දුර්වලතා පිළිබද විස්තර කරන්න.

- මහාවංසය හැඳින්වීම.
- තොරතුරු ලබා ගත හැකි කෙෂ්ත්‍ර හා ඒවා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය මඟින් සනාත වන අවස්ථා
- මහා වංසයෙහි දුර්වලතා විස්තර කිරීම.

3) පුරා විද්‍යාත්මක මූලාශ්‍රය යන්න හඳුන්වා ඉතිහාසය හැදෑරීමේදී පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය වැදගත් වන ආකාරය පිළිබඳ විස්තර කරන්න.

- පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය හැඳින්වීම.
- වෙනත් මූලාශ්‍රයන්ට වඩා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයන් ගේ දැකිය හැකි සුවිශේෂතා
- ඉතිහාසය හැදෑරීමේ දී පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයන්ගේ ඇති වැදගත්කම.

4) ශ්‍රී ලංකාව ජනාවාස වීම එකවර සිදු වූ ක්‍රියාවක් නොවේ දීර්ඝ කාලීන ක්‍රියාවලියක ප්‍රතිඵලයකි. ප්‍රාග් ඓතිහාසික ගල් යුගය හා පූර්ව ඓතිහාසික යුගය ඇසුරෙන් විස්තර කරන්න.

- ප්‍රාග් ඓතිහාසික ගල් යුගය හා පූර්ව ඓතිහාසික යුගය හැඳින්වීම.
- ප්‍රාග් ඓතිහාසික ගල් යුගය හා පූර්ව ඓතිහාසික යුගයේ දැකිය හැකි වෙනස් කම් පිළිබඳ සමාලෝචනය කිරීම.

  I. ජනාවාසවල පිහිටීම.
  II. තාක්ෂණය
  III. ජීවන රටාව
  IV. ආහාර රටාව
  V. අභිචාර විධි

5) පණ්ඩුකාභය රාජ්‍ය සමය ලංකා දේශපාලන ඉතිහාසයේ වැදගත් කඩඉමකි. අදහස් දක්වන්න.

- පණ්ඩුකාභය පූර්ව රාජ්‍ය සමයේ දේශපාලන තොරතුරු
- පණ්ඩුකාභය රාජ්‍යත්වයට පත්වීම.
- දේශපාලන මධ්‍යගත කිරීමට හා විධිමත් කිරීමට රජු ගත් ක්‍රියාමාර්ග

6) ලංකා ඉතිහාසයේ ඉතා වැදගත් පාලකයින් දෙදෙනෙකු වූ දුටුගැමුණු හා වලගම්බා රජතුමගේ දේශපාලන සමාජ සංස්කෘතික කටයුතු වල සමාන අසමානතා පිළිබඳ විවරණයක යෙදෙන්න.
- ඔවුන් රාජ්‍යත්වයට පත්වීමේ දී මුහුණ දුන් අභියෝගයන් හි සමාන අසමාන තා
- දේශපාලන කටයුතු වල සමාන අසමානතා
- සංස්කෘතික කටයුතු වල සමාන අසමාන තා
- සමාලෝචනය

7) රජරට ශිෂ්ටාචාරයේ අවසන් භාගයේ සිටි වැදගත්ම පාලකයා මහා පැරකුම් රජුය. ඒ පිළිබඳ ඔබේ අදහස ගම්‍ය කරන්න.
- පැරකුම් රජුගේ දේශපාලන ආර්ථික කටයුතු විස්තර කිරීම.
- රජරට ශිෂ්ටාරය අවසන් අදියරයේ සිටි අනෙකුත් වැදගත් පාලකයින්ගේ ක්‍රියා කලාපයන් සමග සංසන්දනය කිරීම

8) ශ්‍රී ලංකාවේ වාරිමාර්ග කටයුතු වල සිදු වූ විකාශණය පිළිබද සමාලෝචනයක යෙදෙන්න.
- වාරි කටයුතු වල ආරම්භය ( මුල් ඓතිහාසික යුගයේ සිට)
- රාජ්‍ය අනුග්‍රහයෙන් සිදු වූ වාරි කටයුතු වල සංවර්ධනය

9) දඹදෙණි රාජ වංශයේ දෙවන පැරකුම් රාජ්‍ය සමය දේශපාලනමය වශයෙන් හා සංස්කෘතිකමය වශයෙන් ඉතා වැදගත් කාල වකවානුවකි. විමසන්න.
- දඹදෙණි රාජ වංසයේ ආරම්භය
- දඹදෙණි රාජ වංසයේ පාලකයෝ
- දෙවන පැරකුම් රාජ්‍ය සමයේ දේශපාලන වැදගත්කම.
- සමාජ සංස්කෘතික වැදගත්කම

10) රජරට ශිෂ්ටාචාරය බිදවැටී රාජධාන් නිරිත දිගට විතැන්වීමත් සමග මෙරට ආර්ථිකයේ සිදු වූ වෙනස්කම් පිළිබද විමසුමක යෙදෙන්න.

11) ශ්‍රී ලංකාව අවසාන වතාවට එක්සේසත් කරන ලද හයවන පැරකුම් රාජ සමය ලංකා ඉතිහාසයේ දේශපාලන සමාජ සංස්කෘතික අතින් ඉතා වැදගත් යුගයකි. හයවන පැරකුම් රජුගේ කාර්යයභාරයන් ඇසුරෙන් ඉහත කියමන ප්‍රමාණ කරන්න.

12) උඩරට පළමු විමලධර්මසූරිය රජතුමා රාජ්‍යත්වයට පත්වීමේ දී විසල් අභියෝග රැසකට මුහුණ දුන්නද ඔහු එම අභියෝගයන් සාර්ථකව ජය ගනිමින් උඩරට නව රාජවංශයකට අවශ්‍ය පදනම ගොඩනගන ලදි. ඒ පිළිබඳව ඔබේ අදහස් දක්වන්න.

13) දෙවන රාජසිංහ රජතුමා අභියෝග රැසකට මුහුණ දුන් කීර්තිධර පාලකයෙකි. විමසන්න.

14) ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලනයට එරෙහිව ඇති වු විරෝධතා අරගල හා ඒවා අසාර්ථක වීමට බල පෑ හේතු සාදක පිළිබද විමසුමක යෙදෙන්න.

- ලංකා සිතියමේ පහත සඳහන් සියලුම ස්ථාන ලකුණු කොට නම් කරන්න.

| | | | | |
|---|---|---|---|---|
| 1. උතුරු මැද පළාත | 2. කෝට්ටේ | 3. රයිගම | 4. මඩකලපුව | 5. සුරුල්ලවාපී |
| 6. කලාඔය | 7. කුරුණෑගල | 8. මිනිහාගල්කන්ද | 9.නල්ලූර් | 10.සූරකර තිත්ථ |
| 11 කතරගම | 12 බලන | 13 කළුගග | 14 දඹදෙණිය | 15මින්නේරි වැව |

දැනුම පොතට.........................

## ලන්දේසි පාලනය

**පාලනයේ අරමුණු**

- ❖ ලන්දේසි පාලනය වෙළඳ සමාගමක් විසින් සිදු කරන ලද බැවින් පාලනයේ ප්‍රධාන අරමුණ ද වෙළඳාමෙන් ලාභ ලැබීමයි.
- ❖ වෙළඳාමෙන් ලැබූ ධනය තම මව් රටට යැවීම.
- ❖ වෙළඳාමෙන් ලාභ ලැබීම සඳහා හැකිතාක් දුරට යුධ ගැටුම් වලින් තොරව සාමකාමී පාලනයක් ගෙනයාම.
- ❖ රෙපරමාදු කතෝලික ආගම ප්‍රචාරය කිරීම.
- ❖ ලංකාවේ වෙරළ ආශ්‍රිතව චීන, අරාබි, මලයාර් වෙළෙඳුන් ගෙන ගිය වෙළෙඳ අධිකාරය තමන් සතු කර ගැනීම.

**මධ්‍ය පාලනය**

- ❖ ඕලන්ද රජය

I 1748 බතාවියානු සමූහාණ්ඩු මණ්ඩලය පිහිටවන තුරුම ඔවුන්ගේ යටත් විජිත ඕලන්ද ප්‍රභුරාජ (ස්ටැඩ් හෝල්ඩර් Stadholder) වරයා විසින් පාලනය කරන ලදී.

- ❖ පෙරදිග ඉන්දියා ලන්දේසි වෙළෙඳ සමාගම (එක්සත් පෙරදිග ඉන්දියා වෙළෙඳ සමාගම)

I. 1602 දී වෙළෙඳ සමාගම පිහිටුවීම.

II. පාලනයේ ඉහළම මණ්ඩලය පෙරදිග වෙළෙඳ සමාගමේ අධ්‍යක්‍ෂ මණ්ඩලයයි. (සාමාජිකයන් 17)

III. ඕලන්ද පෙරදිග වෙළෙඳ සමාගමේ අධ්‍යක්‍ෂ මණ්ඩලය මගින් බතාවියවේ අග්‍රාණ්ඩුකාරවරයා හා ඔහුගේ උපදේශක සභාව පිහිටුවන ලදී.

- ❖ ලංකාවේ ඕලන්ද පාලනය

I. බතාවියේ ආණ්ඩුකාරවරයා ප්‍රධාන ඔහුගේ උපදේශක සභාව මගින් ලංකාවේ පාලන කටයුතු සඳහා ආණ්ඩුකාරවරයෙකු පත්කරන ලදී. ඔහු බතාවියෙන් ලැබෙන උපදෙස් පරිදි ලංකාව පාලනය කළ යුතු විය.

II. ලංකාවේ ආණ්ඩුකාරවරයාගේ සභයට උපදේශක සභාවක් විය. එහි සාමාජිකයන් ගණන 9 කි.

1. ආදායම් පාලක (Hoofd Administrateur)
2. කොළඹ දිශාවේ ප්‍රධාන යුද්ධ නිලධාරියා
3. පිස්කල් නිලධාරියා (Public Prosecutor)

**දෙපාර්තමේන්තු නිලධාරීන්**

4. මහලේකම් කාර්‍යයාලය
5. වාණිජ්‍ය කාර්‍යයාලය (Negotie kantoor)
6. ගණක (ගෙවීම් කාර්‍යයාලය)
7. ගබඩා (ගෙවල්)
8. රේගුව

III. උපදේශක සභාව විසින් පාලන කර්තව්‍යයන් කොටස් තුනකට බෙදා පාලනය කරන ලදී.

1. දේශපාලන අංශය (පොලිටික් රාද්) - ජ්‍යෙෂ්ඨ වෙළෙඳ අධිකාරි (Opperkoopinan)
2. යුද්ධ කාර්ය අංශය - මේජර් (Major)
3. නාවුක අංශය - මුහුදු කපිතාන් (Captin cler zee)

- ❖ උසස් තනතුරු ලන්දේසි ජාතිකයන්ට පමණක් හිමිවීම.

- ආණ්ඩුකාරවරයා සිවිල් නිලධාරියෙකු වීම.
- ලංකාවේ ලන්දේසීන්ට අයත් ප්‍රදේශ කොටස් 03 ට බෙදා (කොමාන්ඩරි) 03 කට බෙදා පාලනය කිරීම.
    1. කොළඹ කොමාන්ඩරිය (කල්පිටිය සිට බෙන්තොට දක්වා)
    2. යාපනය කොමාන්ඩරිය (මන්නාරම සිට ත්‍රිකුණාමලය දක්වා)
    3. ගාලු කොමාන්ඩරිය (බෙන්තොට සිට වළවේ ගඟ දක්වා)

**කොළඹ කොමාන්ඩරිය**

- දිසාපතිවරයෙකු යටතේ පාලනය විය.
- කල්පිටිය, මීගමුව හා කළුතර වැනි ප්‍රදේශ ඔපර්හුප් (Opperhoofd) නම් නිලධාරියා බැගින් යොදවා පාලනය කරන ලදි.
- දිසාපතිවරයා යටතේ කුරුඳු දෙපාර්තමේන්තු ප්‍රධානියා ලෙස මහබද්දේ කපිතාන් නම් නිලධාරියෙක් විය.

**යාපනය හා ගාළු කොමාන්ඩරිය**

- උපදේශක මණ්ඩලයක් සහිත කොමාන්ඩරියක් නම් නිලධාරියෙකු විසින් පාලනය කිරීම (කොමදෝරු)
- යාපන ප්‍රදේශයට දිසාපතිවරයෙක් ද පත් කරන ලදි.
- මන්නාරම, ත්‍රිකුණාමලය, මඩකලපුව ආදි ප්‍රදේශවල ඔපර්හුප් නම් නිලධාරීන් මගින් පාලනය කරන ලදි.
- ගාළු කෝරළය සුපරින්ටෙන්ඩන්ට් නම් නිලධාරියෙකු විසින් පාලනය කරන ලද අතර ඔහු මහබද්දේ කපිතාන් පදවිය ද දරන ලදි.

**ප්‍රාදේශීය පාලනය**

- ප්‍රාදේශිය පාලනය දිසාව, කෝරළ, පත්තු ආදි පාලන ඒකකවලට බෙදා පාලනය කිරීම.
- කොළඹ, ගාල්ල, යාපනය ආදි ප්‍රදේශ දිසාපති හා උපදිසාපතිවරුන් යටතේ පාලනය කිරීම.
- අපරාධකරුවන් ඇල්ලීමේ බලතල දිසාපතිවරුන්ට ඇතත් නඩු ඇසීමේ බලයක් ඔවුන්ට නැත.
- ලන්කිරිකද්කද හමුදාව දිසාපතිවරයා යටතේ පාලනය විය.
  පොදු වැඩ, කෘෂිකාර්මික කටයුතු වල වගකීම ඔහුට පැවරින.
- උසස් නිලතල ලන්දේසීන්ට හිමි වූ අතර පහත් නිලතල සිංහලයින්ට හිමි විය. ඉහළ නිලධාරීන් සිංහල භාෂාව සම්ප්‍රදායන් නොදත් නිසා පාලනය යම් දුර්වලතාවයන්ට ද ලක්විය.
- ප්‍රාදේශිය පාලනය සඳහා පැරණි සිංහල නිලධාරී ක්‍රමය සංශෝධන සහිතව ප්‍රයෝජනයට ගෙන ඇත.
- ලන්දේසි ප්‍රාදේශිය පාලනය ද ආර්ථික වාසි ලබා ගැනීම අරමුණු කරගෙන ක්‍රියාත්මක විය.

**ලන්දේසි ආර්ථික ප්‍රතිපත්තිය**

- ලන්දේසි පාලන ප්‍රදේශවල දී සිංහල රජවරුන් විසින් අය කරනු ලැබූ සෑම බද්දක් ම ලන්දේසින් විසින් ද අය කිරීම.
- දේශිය ඉඩම් භුක්ති ක්‍රමය, කුල ක්‍රමය පදනම් කරගත් සමාජ රටාව සහ සාම්ප්‍රදායික චාරිත්‍ර විධි ඇසුරෙන් අඩු වියදමින් ලාභ ලැබීම.
- විශාල ආර්ථික වටිනාකමක් ඇති කුරුඳු සකස් කිරීම හා වෙළඳාම ආදි කටයුතු වෙනම දෙපාර්තමේන්තුවක් (මහබද්දේ) මගින් සංවිධානාත්මකව පවත්වාගෙන යාම.
- වැව් ප්‍රතිසංස්කරණය කිරීම
  Eg :- තිස්සමහාරාම යෝධකණ්ඩිය
  ඌරුබොක්ක වේල්ල ඉදිකර හිරුවාපත්තුවේ වී වගා කිරීම.
- ඉබේ වැවෙන වැව්ලි වලින් සෑහීමකට පත් නොවී කුරුඳු හා කෝපි වගා කිරීම.

(කුරුඳු වතු :- කදිරාන, ඇවරිවත්ත, කුරුඳුවත්ත)

❖ එවකට යුරෝපීය ප්‍රදේශවල වැඩි ඉල්ලුමක් තිබූ පුවක්, බුලත්, ගම්මිරිස්, කරාබුනැටි ආදි වෙළඳ ද්‍රව්‍ය පිළිබඳ අවධානයක් යොමු කිරීම.

❖ දේශීය හස්ත කර්මාන්ත දියුණු කර පවත්වා ගැනීමට පියවර ගැනීම.
Eg :- රන්, රිදී, පිත්තල, ඇත්දත් කැටයම්, ලණු ඇඹරීම

❖ කපු රෙදි ඉන්දියාවෙන් ගෙන්වා සායම් පොවා ලංකාවේ විකුණා ආදායම් ලැබීම.

❖ ඊයම්, තඹ, පිත්තල, වෙඩි ලුණු, ලංකාවට ගෙන්වා විකිණීම.

❖ අපනයනය අරමුණු කරගන අභ්‍යන්තර වෙළෙඳාම මඟින් සාක් බෙල්ලන්, ලුණු, වී, මී ඉටි, පොල් අරක්කු, විනාකිරි, දුම්කොළ ආදිය රැස් කිරීම.

❖ ආණ්ඩුවේ වියදම් අඩුකර ගැනීම අරමුණු කරගන සීමිත වශයෙන් දේශීය කෘෂි අංශය දියුණු කිරීම. Eg :- සහල් ආනයනය වලක්වා ගැනීම අරමුණු කරගන මුතුරාජවෙල අස්වැද්දීම.

❖ උපරිම ලාභ ලැබීමේ අරමුණින් යුධ වැය අඩුකර උඩරට සමඟ සාමකාමී වාතාවරණයක් ඇති කිරීම.

❖ බදු එකතු කිරීමේ අයිතිය වෙන්දේසියේ විකිණීමේ ක්‍රමයක් ඇති කිරීම.

❖ ඇඟ බද්ද, ඌලියම් බද්ද (මරක්කලයින්ගේ හා හෙට්ටින්ගෙන් අයකළ බද්ධ බලහත්කාරයෙන් වැඩ ගැනීම) වැනි බදු අය කිරීම හා බදු එකතු කිරීම විධිමත් කිරීම සඳහා තෝරාබු ක්‍රමයක් ඇති කිරීම.

❖ උක්, ඉන්ඩිගෝ, කපු වැනි දෑ වගා කර සීනි නිපදවීම රෙදි විවීම, වර්ණ කිරීම ආදි කර්මාන්ත පුළුල් කිරීම.

❖ මොරටුවේ වඩු කර්මාන්තය පුළුල් කිරීම.

❖ ආර්ථික කටයුතු කාර්යක්ෂම කිරීම අරමුණු කරගන නිලධාරීන්ගේ හා යටිතල පහසුකම් (ප්‍රවාහන සඳහා ඇල මාර්ග) සංවිධානය.

❖ ඉඩමක එළදාවෙන් හෝ අස්වැන්නෙන් 1/10 සිට 1/2 දක්වා බදු අය කිරීම.

❖ අලි ඇතුන් වෙළඳාම් කටයුතු සඳහා කුරුවේ දෙපාර්තමේන්තුව විධිමත් කිරීම.

❖ සිංහල රජකාලේ පටන් පැවති රාජකාරි ක්‍රමය උපයෝගී කරගන බලකොටු, මං මාවත්, වාරිමාර්ග ඉදිකිරීම සඳහා නොමිලයේ සේවය ලබා ගැනීම.

I. මාතර සිට ගාල්ල, කළුතර, කොළඹ, මීගමුව, හලාවත, පුත්තලම හරහා මන්නාරමට මාර්ගයක් තැනීම.

II. පුත්තලමේ සිට කොළඹට ඇලක් තැනීම.

**ආගමික ප්‍රතිපත්තිය**

❖ දේශපාලන වාසි ලබාගන තම බලය ලංකාවේ තහවුරු කිරීම හා කතෝලික බලය හා බුදුදහම යටපත් කිරීම ලන්දේසි ආගමික ප්‍රතිපත්තියේ මූලික අරමුණය.

❖ ආගම ප්‍රචාරය කිරීම සඳහා විවිධ භාෂාවලින් දේශන පැවැත්වීම, ලන්දේසි බසින් ලියවුණු දස පනත ස්වාමිදරුවන්ගේ ආපදාව වැනි කෘති සිංහල හා දෙමළ බසට පරිවර්තනය කිරීම ආදිය සිදුකරන ලදී.

❖ ආගම ප්‍රචාරය සඳහා අධ්‍යාපනය යොදා ගැනීම හා පාසල කේන්ද්‍ර කරගන ආගම ඉගැන්වීම.

❖ 1656 දී ආගමික ප්‍රචාරක කටයුතු සඳහා පිලිප් බැල්දියස් දේව ගැතිවරයා ලංකාවට පැමිණීම

❖ ආගමික ප්‍රචාරක කටයුතු සඳහා පෙඩිකන්ට්වරුන් නම් නිලධාරීන් පිරිසක් යෙදවීම.

❖ උසස් රැකියා ලබාදීමේ දී ලන්දේසීන් රෙපරමාදු ආගම වැළඳගත්ත වුන්ට ප්‍රමුඛතාව ලබාදීම.

❖ අන්‍යාගමික ළමුන් හෞතිස්ථයෙන් පසු පමණක් පාසල්වලට ඇතුළත් කිරීම.

## ලන්දේසි අධිකරණය

- ලන්දේසීන් විසින් ලංකාවට රෝම ලන්දේසි නීති පද්ධතිය හඳුන්වා දෙන ලදී.
- ලන්දේසීන් ලංකාවට පැමිණෙන විට මෙරට පැවති සිරිත් විරිත් සම්ප්‍රදායන් සැලකිල්ලට ගනිමින් රෝම ලන්දේසි නීතිය සංශෝධනය කරමින් ලංකාවේ දී ක්‍රියාත්මක කරන ලදී.
- කොළඹ පිහිටි ප්‍රධාන උසාවිය රාද් වැන් ජස්ටිටි (Raad Van Justitic) විනිසුරු මඩුල්ලේ ප්‍රධානියා හුෆ්ඩ් අද්මිනිස්ට්‍රාටර් (Hooftd Administratear) විය. අපරාධ නඩු විසඳීම, යුරෝපීය ජාතීන් හා ස්වදේශිකයන් අතර ඇතිවන ගැටුම් විසඳීම එහි කාර්යභාරය විය.
- ලෑන්ද්රාද් (Landraad) උසාවියේ දී ඉඩම් ආරවුල් විසඳූ අතර එහි ප්‍රධානියා වූයේ දිසාවේ වරයාය. (දිසාපති)
- සිවියල්රාද් (Civiel Raad) සුළු ආරවුල් පිළිබඳ උසාවිය.
- එහිදී සිවිල් නඩු විසඳන ලද අතර එහි සභාපතිවරයා වූයේ ආණ්ඩුකාරවරයාගේ පාලක සභාවේ සාමාජිකයෙකි.
- රෝම ලන්දේසි නීතිය අනුව මෙරට පහළම උසාවිය පිස්කල් උසාවිය හා දිසාවේ උසාවියයි. මෙහි නඩු විසඳන ලද්දේ පිස්කල් නම් නිලධාරියෙකු විසිනි.
- කොළඹ පිහිටි රාද් වැන් ජස්ටිටි උසාවියට පහළින් ඇති නඩුවල තීන්දු පිළිබඳ අභියාචනා රාද් වැන් ජස්ටිටි උසාවියට ඉදිරිපත් කළ හැකිය.
- කොළඹ රාද් වැන් උසාවියේ තීන්දු පිළිබඳ බතාවියේ ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනා කළ හැකිය.
- ලන්දේසීන් විසින් යාපනයේ ක්‍රියාත්මක වූ තේසවලාමෙයි නීතිය සංග්‍රහ කොට අධිකරණ කටයුතු සඳහා යොදා ගන්නා ලදී.

## ලන්දේසි අධ්‍යාපනය

- ලන්දේසි අධ්‍යාපනයේ අරමුණු
  1. රෙපරමාදු ආගම ප්‍රචාරය කිරීම.
  2. අධ්‍යාපනය මාර්ගයෙන් ලන්දේසීන්ට ගැති විශාල පිරිසක් බිහි කර ගැනීම.
- ලන්දේසි ගම්පළ පාසල්වල ප්‍රධාන වශයෙන් ක්‍රිස්තියානි ධර්මය පිළිබඳ ප්‍රශ්නෝත්තර හා යාච්ඤා ගීත ද ස්වභාෂාවෙන් ලියවීම හා කියවීම උගන්වන ලදී.
- සෑම පාසලකටම ගුරුවරු 2-4 අතර ප්‍රමාණයක් වූ අතර පාඨශාලා දහයකට එක කතිපේරුවරයෙකු බැගින් පත්කර තිබින.
- ලන්දේසි පාසල් පරිපාලනය කරනු ලැබුවේ පාඨශාලා කොමිසම (Scholarchal Commission) නම් මණ්ඩලයක් විසිනි. එම මණ්ඩලය ආණ්ඩුකාරවරයා විසින් පත් කරන ලදී. සෑම කොමාන්ඩ්‍රියකටම එක බැගින් පාසල් කොමිසම් පිහිටා තිබුණි.
- යුරෝපීය ජාතිකයන් උදෙසා පවත්වන ලද මූලික ඕලන්ද පාසල් 14 ක් තිබූ අතර ඒවා අනාථ පාඨශාලා, පාරිස් පාඨශාලා හා පෞද්ගලික පාඨශාලා වශයෙන් වර්ග කර තිබුණි.
- අනාථ පාඨශාලා හා පාරිස් පාඨශාලා ඕලන්ද ආණ්ඩුවේ ආධාරයෙන් පවත්වා ඇත.
- ද්විතියික අධ්‍යාපනය ලබා දීම කොළඹ සෙමනේරිය මගින් ලබාදී ඇත. මුලදී එහි ඉගෙනීම් කටයුතු ඕලන්ද භාෂාවෙන් උවද පසුකාලීනව ලතින්, ග්‍රීක්, හා හීබෲ භාෂාවන් ද එක්විය. සෙමනේරියේ දී පූජක පක්ෂයට, පාඨශාලාචාර්යවරුන්ට හා කතිසේරුවරුන්ට ඉගැන්වීම සිදු කරන ලදී.

## ලන්දේසීන් යටතේ සමාජ හා සංස්කෘතික බලපෑම

- දේශීය ඉඩම් භුක්තිය කුල ක්‍රමය පදනම් කරගත් සමාජ හා සාම්ප්‍රදායික චාරිත්‍ර විධි තුළින් හැඩ ගැසුණු සිංහල පරිපාලන ව්‍යුහය වෙනස් නොකර අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමයෙන් ප්‍රයෝජන ගැනීම.
- රෝම ලන්දේසි නීති ක්‍රමය.
- අධිකරණ ක්‍රමය විධිමත් කිරීම.
- තේසවලාමෙයි නීතිය සංග්‍රහ කිරීම.
- 1739 මුද්‍රණාලයක් ඇරඹීම.
- බටහිර වෛද්‍ය සේවයක් ආරම්භ කිරීම.
- ලාදුරු රෝගය පැතිරීම හා ලාදුරු රෝහල ඉදි කිරීම.
- රෙපරමාදු ආගම වැළඳගත් වුන්ට රජයේ උසස් රැකියා හිමිවීම.
- ලන්දේසි පාසල් වල ඉගෙනීම සඳහා රෙපරමාදු ආගමේ බෞතීෂ්ම ලැබීම අනිවාර්ය වීම.
- හිංදු, බෞද්ධ, රෝමානු කතෝලිකයන් මර්ධනය සඳහා විවිධ ක්‍රියාමාර්ග ගැනීම.
- ආදුරුප්පු වීදියේ පල්ලිය හා පාසල වැනි ඕලන්ද ගෘහ නිර්මාණ ශිල්පයට අනුව ඉදි වූ ගොඩනැගිලි හා ගෘහ නිර්මාණ ශිල්පයට දායාද වීම.
- ලන්දේසි හා සිංහල මිශ්‍ර විවාහයන් සිදුවීම.
- ලන්දේසි භාෂාවේ වචන සිංහල භාෂාවට දායාද වීම.




අයි. එම්. ධම්මික කුමාර ඉලංකෝන්
ගුරු උපදේශක (සමාජ විද්‍යා)
කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය
කුරුණෑගල